ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණ සහතික පත්‍ර වැඩසටහන - දෙවන මට්ටම
අවසාන පරීක්ෂණය - 2018
මෙහෙයුම් කළමනාකරණයට හැඳින්වීමක් - MCC1105

කාලය : පැය දෙක (02)යි.

| | |
|---|---|
| දිනය : 2018.10.27 | වේලාව: පෙ.ව.10.00 - මධ්‍යාහ්න 12.00 |

උපදෙස්:

- ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.

ප්‍රශ්න අංක 01.

(අ) "මෙහෙයුම් කළමනාකරණය ඉලක්ක වෙළඳපලක වුවමනාවන් සපුරාලීම සඳහා වන නිමැවුම් නිර්මාණයට අවශ්‍ය වන සම්පත් යොදා ගනී. එය ඕනෑම ව්‍යාපාරයක එක් මූලික ව්‍යාපාරික කාර්යයකි."
ව්‍යවසායකයකුට මෙහෙයුම් කළමනාකරණයේ ඇති වැදගත්කම උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ආ) "සෑම මෙහෙයුම් / නිෂ්පාදන පද්ධතියක්ම යෙදවුම් - පරිවර්තන ක්‍රියාවලිය - නිමැවුම් යන ආකෘතිය යටතේ දර්ශනය කළ හැක".
බේකරියක පරිවර්තන ක්‍රියාවලිය සුදුසු රූපසටහනක් සමඟ විස්තර කරන්න. (ලකුණු 15)
**(මුළු ලකුණු 25)**

ප්‍රශ්න අංක 02

(අ) ඔබ කාබනික එළවළු විකිණීමේ සිල්ලර වෙළඳසැලක් ආරම්භ කරනවා යැයි සිතන්න. මෙහෙයුම් කටයුතු ඇරඹීමට පෙර ඔබ විසින් සලකා බැලිය යුතු වෙළඳපල සාධක මොනවාදැයි හඳුනා ගන්න. (ලකුණු 10)

(ආ) "ක්‍රියාවලි සැලසුම්කරණයේදී නිෂ්පාදන කාර්යය සඳහා අවශ්‍ය හොඳම සම්පත් සංයෝජනය කිරීම සිදුවේ". නිෂ්පාදන සැලසුම්කරණ ක්‍රියාවලියේ පියවරයන් පැහැදිලි කරන්න. (ලකුණු 15)
**(මුළු ලකුණු 25)**

ප්‍රශ්න අංක 03

(අ) ඔබ සේවකයන් 15 දෙනෙකුගෙන් සමන්විත කුඩා පරිමාණ ඇඟලුම් ව්‍යාපාරයක් ඔබගේ නිවසෙහි ආරම්භ කිරීමට අපේක්ෂා කරයි. ඔබගේ ඇඟලුම් ව්‍යාපාරය පිහිටුවීම සඳහා ස්ථානයක් තීරණය කිරීමේදී සලකා බලන සාධක මොනවාදැයි හඳුනා ගන්න. ඔබගේ ස්ථානීය තීරණය නිවැරදිද? කරුණු දක්වන්න. (ලකුණු 15)

(ආ) "ඔබගේ ඇඟලුම් කර්මාන්ත ශාලාව සඳහා මනා බිම සැලසුමක් තිබීම මගින් බොහෝ වාසි අත්කර ගත හැක". සාකච්ඡා කරන්න. (ලකුණු 10)
**(මුළු ලකුණු 25)**

ප්‍රශ්න අංක 04

"විසිවන ශතවර්ෂය ආරම්භයේදී ෆෙඩ්රික් ටේලර් විසින් ප්‍රථම වරට වැඩ මැනීම සිදු කරන ලදී".

(අ) 'වැඩ මැනීම' යන්නෙන් කුමක් අදහස්වේද? (ලකුණු 05)

(ආ) ඔබ සේවය කරන ස්ථානයේ වැඩ මැනීම සඳහා භාවිතා කළ හැකි විධි ක්‍රම පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ඇ) පිරිවැය ඇස්තමේන්තු කිරීම අනාගත සැලසුම්කරණය සඳහා ප්‍රසශ්ථ පුරෝකථනයකි. උදාහරණ සමග පැහැදිලි කරන්න. (ලකුණු 10)

**(මුළු ලකුණු 25)**

ප්‍රශ්න අංක 05

(අ) 'අඛන්ඩ නිෂ්පාදනය' (Continuous production) 'සවිරාම නිෂ්පාදනය' (Intermittent production) 'පාරිභෝගික අභිරුචිය මත නිෂ්පාදනය' (Custom Production) යන නිෂ්පාදන පද්ධති පැහැදිලි කරන්න. මෙම එක් එක් නිෂ්පාදන පද්ධතීන් වඩාත් යෝග්‍ය වන අවස්ථා විස්තර කරන්න. (ලකුණු 15)

(ආ) ස්පෘශ්‍ය භාණ්ඩයකට වඩා සේවාවක ගුණත්වය මැනීම දුෂ්කර කාර්යයකි. උදාහරණ දක්වමින් තහවුරු කරන්න. (ලකුණු 10)

**(මුළු ලකුණු 25)**

*- හිමිකම් ඇවිරිණි -*